**සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම - 2017**

---

සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2018 ඔක්තෝබර් 25 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

---

සමාගම විසින් අවසන්වරට පිළියෙළ කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම් හා හිමිකම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **වත්කම්** | **2016.12.31** | **2015.12.31** |
|---|---|---|
| | **රු. මිලියන** | **රු. මිලියන** |
| ජංගම නොවන වත්කම් | 14,764 | 12,262 |
| ජංගම වත්කම් | 2,634 | 1,785 |
| මුළු වත්කම් | 17,398 | 14,047 |
| බැරකම් | | |
| හිමිකම් | 2,349 | 1,941 |
| ජංගම නොවන වගකීම් | 14,086 | 10,078 |
| ජංගම වගකීම් | 963 | 2,028 |

| | | |
|---|---|---|
| | ---------- | -------- |
| මුළු බැරකම් | 17,398 | 14,047 |
| | ===== | ==== |
| ආදායම් | 9,006 | 8,011 |
| වියදම් | 8,679 | 8,023 |
| | --------- | --------- |
| අතිරික්තය/ඌණතාවය | 327 | (12) |
| | ===== | ===== |

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව, සමාගමේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත යැවිය යුතු වුවද 2018 ඔක්තෝබර් 29 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

කර්මාන්ත ශාලා නවීකරණ ව්‍යාපෘතිය සහ බඩල්ගම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය හේතුවෙන් සමාගමෙහි තෝලණ අනුපාතය 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා 0.64 සිට 5.99 දක්වා වැඩිවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව, වර්තමානයේ ආයතනය සතුව පවතින තාක්ෂණික දැනුම,වෙළඳපොළවල් හා සැපයුම්කරුවන්,සංවිධාන ව්‍යුහය හා සැලසුම් කාල සීමාව තුල ඉටුකළ යුතු ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් කළමණාකරණ වගකීම දක්වමින් ක්‍රියාකාරී සැලැස්ම, 2015-2017 දක්වා වූ සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වියදම් පමණක් ඇතුලත් කර තිබූ අතර මෙහෙයුම් වියදම් ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම හා ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා කිරීම සඳහා පිළිවෙලින් රු.මිලියන 660.42 ක් හා රු.මිලියන 207.95 ක් අයවැය අනුව වෙන්කර තිබුණු නමුත් 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාගමේ කිරි නිෂ්පාදනයන්හි ප්‍රගතිය පරික්ෂා කර බැලීමේදී 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී ජීවානුහරන කිරි නිෂ්පාදනය සියයට 47 කින් වැඩි වී තිබූ නමුත් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 36 කින් අඩුවී තිබුණි. තවද චීස් නිෂ්පාදනය 2016 වර්ෂයේදී සියයට 59 කින් හා සමාලෝචිත වර්ෂයේදී සියයට 29 කින් අඩු වී තිබුණි. බටර් නිෂ්පාදනය 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 32 කින් හා පිටිකිරි නිෂ්පාදනය සියයට 69 ක් දක්වා අඛණ්ඩව වැඩි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

තොග සමීක්ෂණය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අබේවෙල කර්මාන්තශාලාව

අබේවෙල කර්මාන්තශාලාවේ 2017 දෙසැම්බර් 26 දින සිට 30 දින දක්වා සිදුකල තොග සමීක්ෂණය අධීක්ෂණය කිරීමේදී දුර්වල ගබඩා පරිපාලනයක් පැවති බව නිරීක්ෂණය විය. තවද, වෙළඳ අගය රු. මිලියන 13 ක් වූ කිරිපිටි තොගවලට හානි සිදුවී තිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

(i) කිරිපිටි, ප්‍රධාන වශයෙන් ගබඩා දෙකක අසුරා තිබූ අතර එයින් ප්‍රධාන ගබඩාවේ වහලයේ සිදුරු තුළින් වැසි ජලය කාන්දු වී අගල් 3ක් පමණ උසකට ජලය පිරී තිබුණි. තවද, කිලෝග්‍රෑම් 25 බැගින් අසුරා ඇති කිරිපිටි බහාලුම් 178 ක් එනම් වෙළඳ අගය රුමිලියන 3 ක් වන කිරිපිටි කිලෝග්‍රෑම් 4,450 ක් සිදුරු වී කිරිපිටි පිටතට පැමිණ තිබූ අතර වර්ෂාවට තෙමීම, බැග් පුපුරා යාම, පැලට්වලට සිරවී පළුදු වීම වැනි විවිධ හානි වලට ලක්වී තිබුණි.

(ii) ගබඩාවේ කිරිපිටි තොග ක්‍රමවත් ලෙස එනම් සංකේත අංක අනුව, භාණ්ඩ අංක අනුව , කල් ඉකුත් වන දින අනුව හා ආරක්ෂිතව ගබඩා කිරීමක් සිදුකර නොතිබුණි. තවද ,තොග නිකුත් කිරීමේදී ගබඩාවට මුලින් ලද තොග මුලින් නිකුත් කිරීමක් සිදුකර නොතිබුණු අතර තොග සඳහා පහසුවෙන් ලඟා වීමට නොහැකි ලෙස ගබඩා පවත්වා ගැනීම එයට හේතු වී තිබුණි. 2018 පෙබරවාරි 01 දින වනවිට කල් ඉකුත් වීමට ආසන්නව පැවති වෙළඳ අගය රු.මිලියන 2.6 ක් වූ කිරිපිටි කිලෝග්‍රෑම් 3,900 ක් සහ කල් ඉකුත් වී සත්ව ආහාර ලෙස වර්ග කළ කිරිපිටි කිලෝග්‍රෑම් 10,750 ක් පැවති අතර ඒවායේ වෙළඳ අගය රු.මිලියන 7.4 ක් විය.

(ආ) පොලොන්නරුව කර්මාන්ත ශාලාව

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඩීසල් තොග භෞතිකව සත්‍යාපනය කිරීමකින් තොරව වාර්තාවල ඇතුලත් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට රසායනික තොග වටිනාකම රු. 174,420 කට අගය කල නමුත් 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරාසය තුල කල් ඉකුත්වී හා දැනට භාවිතා නොවන රසායනික ද්‍රව්‍ය වර්ග 26 ක් ඒ තුල ඇතුලත්ව තිබූ අතර බොහෝ රසායනික ද්‍රව්‍යවල නිෂ්පාදන දිනය හා කල් ඉකුත් වීමේ දිනයන් සඳහන් නොවුණි. තවද, භාවිතයට ගත නොහැකි, වටිනාකම රු. 3,164,057 ක්වූ ඇසුරුම් ද්‍රව්‍ය තොග අයිතම 5 ක්ද 2017 දෙසැම්බර් 31 දිනට තොගයෙහි ඇතුලත්ව පැවති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද තොග අගය කිරීම් වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිරි එකතු කිරීමේදී කර්මාන්ත ශාලා වෙත ලැබෙන කිරි ප්‍රමාණයට වඩා වැඩි කිරි ලීටර් ප්‍රමාණයකට ගෙවීම් කිරීම හේතුවෙන් මිල්කෝ ආයතනය 2017 වර්ෂයේ දී රු.73,343,796 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. කිරි එකතු කරන මධ්‍යස්ථාන නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක නොකිරීම හා ප්‍රධාන කාර්යාලයට දත්ත සම්ප්‍රේෂණය කර ස්වයංක්‍රීයව අධීක්ෂණය කල හැකි පරිදි කර්මාන්ත ශාලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නව කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉදි නොකිරීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව, අඹේවෙල කර්මාන්ත ශාලාවේ රු.124,587,211 ක් වටිනා කිරි ලීටර් 1,813,226 ක අසාමාන්‍ය තොග හානියක් හා 2017 ජූලි දක්වා සියයට 2 ක් වූ සාමාන්‍ය අපතය, සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට සියයට 4 ක් දක්වා වර්ධනය වී ඇති බවත් නිරීක්ෂණය විය.

## 4.4 කාර්යමණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ප්‍රකාරව, කාර්ය මණ්ඩලය සඳහා බඳවාගැනීමේ පරිපාටි සකස් කර 2018 ඔක්තෝබර් 25 දක්වාම අනුමත කරවා ගෙන නොතිබුණි. තවද, 2008 නොවැම්බර් 07 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය 1420 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 1471 ක් වූයෙන් ඒ අනුව පුරප්පාඩු 51 ක් පැවතුණි.

## 5 තිරසාර සංවර්ධනය

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණද, ඊට ගැලපෙන පරිදි සමාගමේ ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන්ද, හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනයන්

### (අ) කර්මාන්ත ශාලා නවීකරණ ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විදේශ ආයතනයක් වන ඩෙස්මි ආයතනය විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට යොමු කර තිබූ කර්මාන්තශාලා 4 ක් නවීකරණය කිරීම, කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 80

ක් අළුත් වැඩියා කිරීම හා නව මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාල, යෝජනාවලිය අමාත්‍ය මණ්ඩලය මගින් පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් ඇගයීමට ලක් කර තිබුණි. ඒ අනුව, ඉදිරිපත් කල වාර්තාවට අනුව, 2009 දෙසැම්බර් 31 දින යුරෝ. මිලියන 39.1 කට සමාගම සහ ඉහත ආයතනය අතර කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර තිබුණි. නමුත්, 2011 ජුනි 24 දින සමාගමේ සභාපති විසින් එම ආයතනයට ලිපියක් යොමු කර යුරෝ මිලියන 2.37 ක් වෙන් කර තිබූ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 80 ක් අළුත් වැඩියා කිරීම හා මධ්‍යස්ථාන 20 ක් ඉදිකිරීමේ කාර්යයන් ඉවත්කර රු.මිලියන 33.78 කට නව යෝජනාවක් ඉදිරිපත් කර 2012 ජනවාරි 12 දින නැවතත් නව ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් තාක්ෂණික ඇගයීම් කමිටුව පළමුව ව්‍යාපෘතිය ඇගයීමට ලක්කර ඇත්තේ යන්ත්‍ර ධාරිතාවය උපරිමයෙන් සිදුවනු ඇති බව උපකල්පනය කර බැවින් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම හා නව මධ්‍යස්ථාන ඉදිකල යුතු වුවත් නව කොන්ත්‍රාත් ගිවිසුම් මගින් එම කාර්යය ඉවත් කිරීම හා විකල්පයන් ඉදිරිපත් නොවීම මත ව්‍යාපෘතියේ ඵලදායීතාවය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) ණය වටිනාකම රු.5,854,450,856 ක් (යුරෝ 33,779,210) යටතේ පොලොන්නරුව, දිගන, හා අඹේවෙල යන කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවීමෙන් තොරව ටර්න් කී (Turnkey) ක්‍රමය යටතේ තෝරාගත් විදේශ කොන්ත්‍රාත් ආයතනය හා මිල්කෝ පුද්ගලික සමාගම අතර ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2014 ජුලි 12 දිනෙන් අවසන් විය යුතුය. නමුත් දිගන හා අඹේවල කිරි කර්මාන්තශාලා නවීකරණ කටයුතු 2017 ජුලි 31 දින දක්වාම නිම කර නොතිබූ අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමට හෝ ප්‍රමාද ගාස්තු වශයෙන් එකඟ වී ඇති වටිනාකම අය කර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද 2017 ජූලි මාසය වන විට ගිවිසුම මාස 36 කට වඩා ප්‍රමාදව පවතින අතර ප්‍රමාද ගාස්තු ලෙස යුරෝ 1,688,961 ක මුදලක් අයකර ගත යුතුව පැවතුණි.

(iii) ඉහත කර්මාන්තශාලා නවීකරණ ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේදී ඇතිකර ගත් කොන්ත්‍රාත් ගිවිසුම් වලට අනුව, 2013 වර්ෂයේදී එච්එස්බීසී බැංකුව හා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අතර මෙන්ම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා සමාගම අතර ඇති කරගත් ණය ගිවිසුම අනුව සියයට 2 ක වාණිජ නොවන හා සියයට 6 +LIBOR ක වාණිජ ණය පොළී අනුපාතයක් මත ගිවිසගත් රු.5,854,450,856 ක් (යුරෝ 33,779,210) වූ ණය මුදල යටතේ වාණිජ ණයකටද එකඟවී තිබුණි. ඒ අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා සමාගම අතරත් එම පොළී අනුපාත යටතේම උප ණය ගිවිසුමකට එළඹ තිබුණි. එම ණය සඳහා 2017 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවිය යුතු හිඟ මුදල මුල් ණය මුදලට අනුව රු. 3,554,761,168 ක් වූ අතර අනුව අදාල ගිවිසුම් ප්‍රකාරව මුදල් ගෙවීම් සඳහා සමාගම කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) බඩල්ගම ව්‍යාපෘතිය

------------------------

එච්එස්බීසී බැංකුව හා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අතර ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව, සියයට 1.90 ක වාණිජ නොවන සහ සියයට 5 + LIBOR ක වාණිජ ණය පොළී අනුපාතයක් මත ගිවිසුම් ගතවූ රු. 9,932,709,286 ක ණය මුදල යටතේ සමාගම සතු නාරාහේන්පිට කර්මාන්තශාලාව බඩල්ගම වෙත ගෙන යෑමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 මාර්තු 04 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුව පහත දැක්වෙන කරුණු හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කිරීමට 2015 මාර්තු 07 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි එහෙත් 2015 අප්‍රේල් 08 දින අදාල ණය මුදල් සඳහා වසර තුනක සහන කාලයක් හා මිල්කෝ සමාගමට ප්‍රතිණය මුදලක් ලබාදීමට යටත්ව නැවත ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුව, 2015 අප්‍රේල් 23 දින ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් 2018 ඔක්තෝබර් 19 දින දක්වාම සමාගම හා භාණ්ඩාගාරය ප්‍රතිණය ගිවිසුමකට එළඹ නොතිබුණි.

- ණය ආපසු ගෙවීමට මිල්කෝ සමාගමට හැකියාව නොමැති වීම.

- රජයේ ප්‍රතිපත්තිය පරිදි කිරි මිල ඉහල නැංවීමත් එයට සාපේක්ෂව කිරි නිෂ්පාදනවල මිල ඉහල නොදැමීමත් මත මූල්‍ය ප්‍රවාහයෙහි අඩුවීමක් සිදුවීම හේතුවෙන් සමාගම දැඩි මූල්‍ය අර්බුදයක සිටින බවත් තවදුරටත් ණය ලබාගැනීම තුලින් එම මූල්‍ය අර්බුදය උග්‍ර වන බව,

- යෝජිත කර්මාන්ත ශාලා නවීකරණය මගින් නිෂ්පාදනය සඳහා දිනකට කිරි ලීටර් 200,000 ක් පමණ අවශ්‍ය බවත්, ඒ අනුව සමාගම කිරි ලීටර් 600,000ක් පමණ ලබාගත යුතු අතර එය රටේ නිශ්පාදනයෙන් සියයට 75 ක් පමණ බවත් කර්මාන්ත ශාලාව පිහිටවනු ලැබුවහොත් කිරි සපයාගැනීමේ උග්‍ර අර්බුදයකට මුහුණ දෙන බව.

(ii) 2013 ජුනි 05 දිනැති අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් ඩෙස්මි කොන්ට්‍රැක්ටින් ඒජන්සීස් සහ බොක්කාර්ඩ් ෆුඩ් ෆර්මා ආයතනය ඇගයීමකට ලක් කර වඩාත් වාසිදායක ආයතනයක් ලෙස බොක්කාර්ඩ් ෆුඩ් ෆර්මා ආයතනය නිර්දේශ කර තිබුණි. එහෙත් 2015 අප්‍රේල් 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ව්‍යාපෘතිය සඳහා standalone හා Unsolicited යෝජනාවලියක් ලෙස දක්වා ලංසු කැඳවීමෙන් තොරව ටර්න් කී (Turnkey) පදනම යටතේ ඩෙස්මි කොන්ට්‍රැක්ටින් ඒජන්සීස් වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට තීරණය කර 2015 මැයි 19 දින එම සමාගම සමග කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුලත්වී තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- 2013 ජුනි 05 දිනැති අමාත්‍යාංශ ඇගයීම් කමිටු යෝජනාව අනුව, ඩෙස්මි කොන්ට්‍රැක්ටින් ඒජන්සීස් ආයතනයේ මිල බොක්කාර්ඩ් ෆුඩ් ෆර්මා ආයතනයට වඩා යූරෝ මිලියන 10 ක (රු.මිලියන 1750) වැඩිවීමක් පවතින බව නිරීක්ෂණය විය.

- ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2014 අගෝස්තු 20 දින ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල කමිටු වාර්තාවට අනුව, ඩෙස්මි කොන්ට්‍රැක්ටින් ඒජන්සීස් සමාගම විසින් සිදු කිරීමට අපේක්ෂිත ඉදිකිරීම්වල වටිනාකම යූරෝ 4,000,000

(රු.596,952,800) ක් පමණ සාධාරණ අගයට වඩා ඉහළ අගයක් පෙන්නුම් කරන බව දක්වා තිබුණි. තවද මිල්කෝ ආයතනය නවීකරණ කටයුතු අවසන් කිරීමෙන් පසු නිෂ්පාදන කටයුතු සිදු කිරීම සඳහා අපේක්ෂිත දෛනික කිරි ප්‍රමාණය කිරි ලීටර් 650,000 ලෙස ඇස්තමේන්තු කර තිබුණද ශ්‍රී ලංකාවේ දෛනික කිරි ප්‍රමාණය කිරි ලීටර් 1,085,473ක් පමණක් බැවින් ඒ අනුව සමාගමේ කිරි එකතු කිරීම සියයට 50 සීමාව ඉක්ම විය යුතු අතර එය සීමාකාරී සාධකයක් වන බවද දක්වා තිබුණි.

(ඇ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමෙන් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරාගත් සැපයුම්කරුවකුගෙන් කොළඹ කර්මාන්තශාලාවට යෝගට් මිශ්‍ර කරගැනීමේ යන්ත්‍රයක් 2011 ජනවාරි 20 දින කල්බදු පදනම මත රු. මිලියන 104.17 කට මිලදී ගෙන තිබූ අතර 2017 ජුලි මාසය දක්වාම එය භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ආයතනය වෙත භාරදී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් පාලනය | (i) | රජයේ අපේක්ෂිත අරමුණු හා ඉලක්ක වලට සමගාමීව සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ලේඛනය, හා කාර්යසාධන වාර්තා සකස් කර නොතිබුණි. |
| | | (ii) | කිරි එකතු කරන මධ්‍යස්ථාන නිසි අධීක්ෂණයක් නොකිරීම, ප්‍රමාණවත් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉදි නොකිරීම හේතුවෙන් ප්‍රයෝජනයට ගන්නා කිරි අපතේ යෑමට ඉඩහැරීම. |
| (ආ) | තොග කළමනාකරණය | | තොග ක්‍රමවත්ව ගබඩා නොකිරීම හේතුවෙන් විනාශවීම, කල් ඉකුත්වීම් පැවතීම හා තොග ගණනය කිරීම අවිධිමත් වීම. |